# රු බදූලූ දේශය



බිනුවරී සෙසාක්‍යා බණ්ඩාර

# රූ බදුලු දේශය

## බිනුවරී සෙසාක්‍යා බණ්ඩාර

කතාව හා චිත්‍ර - බිනුවරී සෙසාක්‍යා බණ්ඩාර

ISBN - 978-624-208-060-4

දිනය - 2023.12.10

වෙනත් කෘති - එකමුතු වදුරු රංචුව , පුංචි මාළු යාළු

# පිදුම

නිරතුරුම මා හට

සෙනෙහස මෙන්ම ශක්තිය

ලබාදෙන

දෙමව්පියන්ට ආදරෙන්.....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාටර් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාථර්නා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20

එකමත් එක කාලෙක රෑ බදුලු දේශයක් තිබුණා.
ඒ දේශයේ තිබුණා ගමක්.
ඒ ගමේ තිබුණා පුංචි ගෙදරක්.
ඒ ගෙදර හිටියේ අම්මායි, තාත්තායි, දූවයි.
ඒ රෑ බදුලු පවුල සතුටින් ජීවත් වුණා.

ඒ දුවගේ නම ඇල්ෆියා.
ඇල්ෆියාව මුළු ගමම
හොඳින් අඳුරනවා.
එක දවසක් ඇල්ෆියයි,
එයාගේ අම්මායි,
තාත්තායි විනෝද
චාරිකාවක් ගියා.
ඒ විනෝද චාරිකාව යන
අතරේ එයාලා සින්දු

කිව්වා, නැටුවා , ගොඩාක් විනෝද වුණා.

ඊට පස්සේ එයාලා ගෙදරින් හදාගෙන ආපු කෑම කන්න කැලයකට ගියා. කැලෑවේ ලස්සන දැක්ක ඇල්ෆියා සතුටින් වටපිටාවේ ඇවිදින්න පටන් ගත්තා.



එතකොට අම්මායි,
තාත්තායි කිව්වා
"වැඩිය දුර යන්න එපා
දුවේ." කියලා.
ඇල්ෆියා ඒක ඇහුවේ නෑ.
ඇල්ෆියා දැක්කා ලස්සන
මලක්.
ඉතිං ඇල්ෆියා ඒ මල
ළඟට ගියා.

එතකොට ඒ මල ටිකත්
ඉස්සරහට ගියා.
ඒක තව තවත් ඉස්සරහට
ගියා.
ඇල්ෆියාත් මල පස්සෙන්
ඇතට ගියා.
ටික දුරක් ගියාම
ඇල්ෆියාට හිතුණා
“ මේ මල පස්සෙන්

ගියොත් මට අම්මලාව

හොයාගන්න බැරි වෙයි.”
කියලා.
ඊට පස්සේ ඇල්ෆියා පිටි
පස්ස බැලුවා.
එතකොට තමයි එයාට
තේරුණේ එයා අම්මාවයි,
තාත්තාවයි පහු කරලා

ගොඩක් දුර ඇවිත් කියලා.
ඊට පස්සේ ඇල්ෆියා
ඉස්සරහා බැලුවා.
එතකොට ඇල්ෆියා
දැක්කා එයාගේ
ඉස්සරහයින් ලොකු
කකුලක් තියෙනවා.
බලනකොට ඒ

මනුස්සයෙක්ගේ

කකුලක්.

ඊට පස්සේ ඇල්ෆියා

ඉක්මනින් එහා

පැත්තට පැන්නා.

මනුස්සයා ගියා.



දැන් ඇල්ෆියා අතරමං
වෙලා.
ඇල්ෆියා ඉස්සරහට
ඇවිදගෙන ගියා.
එයා දැක්කා ගොඩක් ඇත
ලස්සන මාලිගාවක්
තියෙනවා.
ඇල්ෆියා ඒ මාලිගාවට
ගියා. එයා පුදුම වුණා.

ඒ මාලිගාව ඇතුළේ ලස්සන සුරංගනාවියක් හිටියා. ඊට පස්සේ ඇල්ෆියා එයාට වුණ දේ සුරංගනාවියට කිව්වා. සුරංගනාවිය කිව්වා " ඔය මල ඇත්ත මලක් නෙවෙයි. ඒ මල රාක්ෂ මලක්. ඒ මල ගොඩක් ළමයින්ව අතරමං




කරනවා. පොඩ්ඩක්
ඉන්න මම ඔයාව අම්මයි,
තාත්තයි ළඟට
යවන්නම්.”
ඊට පස්සේ
සුරංගනාවියගේ මායා
බලෙන් ඇල්ෆියාව ආය
ගෙදර
යැව්වා.ඇල්ෆියාගේ
අම්මායි තාත්තායි

ගොඩක් බය වෙලා හිටියේ.

"අම්මේ, තාත්තේ මම ආයේ නම් ඔයාලා කියන දේ අහනවා. කවදාවත් අහන්නේ නැතුව ඉන්නේ නෑ. මම ඔයාලාට ආදරෙයි." ඇල්ෆියා අම්මටයි, තාත්තාටයි කිව්වා.

ඊට පස්සේ ඇල්ෆියායි, අම්මයි, තාත්තයි සතුටින් ජීවත් වුණා. දැක්කා නේද පුංචි ඔයාලාත් වැඩිහිටියෝ කියන දේ ඇහුවේ නැත්නම් ඇල්ෆියා වගේ ලොකු කරදරයකට මුහුණ දෙන්න වෙනවා.

පුංචි ඔයාලාත්
වැඩිහිටියෝ කියන දේ
අහන්න ඕනි..



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පයෙර්ෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිමර්ාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදශර්නයකරන කැඩපතකි මෙම නිමර්ාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාශර්වයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිමර්ාතෘ

2023.10.20